773

# දාරක වත්පිළිවෙත් හා බැඳි සබරගමු සම්ප්‍රදායේ බලි පාවාදීමේ සිරිත පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

FACULTY OF GRADUATE STUDIES
RECEIVED
02 NOV 2012
UNIVERSITY OF KELANIYA

**කේ.එම්. සමන් කුමාරතුංග**

**FGS / 04 / 02 / 08 / 2003 / 01**

ප්‍රවේශ අංකය: 773
වර්ග අංකය:

**කැලණිය විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර පීඨයේ සිංහල දර්ශනපති උපාධිය සඳහා ඉදිරිපත් කරන ලදි.**

**2010 ජූලි**

# නිබන්ධ සාරාංශය

සබරගමුවේ අතීතයේ සිට පැවත එන ශාන්තිකර්ම සම්ප්‍රදාය නිශ්චිතව හඳුනා, එහි අන්තර්ගත දාරක වත්පිළිවෙත් හා බලි පාවාදීමේ චාරිත්‍ර, අදෘශ්‍යමාන බලවේග, ශාන්තිකර්ම පූජා විධි හා සැරසිලි, චිකිත්සා ක්‍රමයන්හි සමාජීය වැදගත්කම පිළිබඳ විමර්ශනයක් මෙයින් ඉදිරිපත් කෙරේ.

ඉහත පිළිවෙත් විවිධ මතවාදයන්ට තුඩුදුණි. කෑගල්ල සහ රත්නපුර දිස්ත්‍රික්ක තුළ ව්‍යාප්ත සියලු වත්පිළිවෙත් සබරගමුව සම්ප්‍රදාය බව බොහෝ දෙනාගේ පිළිගැනීම වේ. එහෙත් අතීත සබරගමුව හා ශාන්තිකර්ම සම්ප්‍රදාය නිශ්චිතව හඳුනාගෙන එය මෙහි පළමු පරිච්ඡේදයෙන් අධ්‍යයනය කෙරේ.

බලියාග යනු ජ්‍යෝතිෂය පදනම් කොට අපල දුරුකරනු වස් පවත්වන ග්‍රහ යාග යැයි බහුතර මතය විය. ඒ මතු නොව ස්ත්‍රී රෝග, ප්‍රජනනය ආශ්‍රිත රෝග නිවාරණයට බලියාග පවත්වන බව සනාථ කර, දාරක වත්පිළිවෙත් ගැන අධ්‍යයනයක් මෙහි දෙවන පරිච්ඡේදයෙන් දක්වේ.

බලි පාවාදීම යනු, බලි අඹන අයුරු කවියෙන් ගැයීම බව විද්වත් මතය විය. එහෙත් සහනය අපේක්ෂා කරන්නා වෙනුවෙන් සංවිධිත විය යුතු සකල විධ චාරිත්‍ර අන්තර්ගත සිද්ධියක් එයින් විශද වන බව මෙහි තෙවන පරිච්ඡේදයේ දක්වේ.

උපලක්ෂිත යාගයන්හි ඇදුරෙකු ලෙසද, වාදකයෙකු ලෙස ද නිරත වී දීර්ඝ කාලයක් රැස්කළ දත්ත විමර්ශනය කර අදාළ යාගවලට ආවේණික පූජා විධි මෙහි සිව්වන පරිච්ඡේදයෙන් ඉදිරිපත් කෙරෙන අතර ඒවායෙහි සැරසිලි, රංගවස්ත්‍රාභරණ පිළිබඳ මෙහි පස්වන පරිච්ඡේදයේ සවිස්තර කර තිබේ.

දාරක යාග පිළිවෙත්හි කායික, මානසික චිකිත්සා ක්‍රම, ඉපැරණි මානව ලක්ෂණ හා ඒවායේ සමාජීය වැදගත්කම හයවන පරිච්ඡේදයෙන් විවරණය කෙරෙන අතර සමස්ත පර්යේෂණයෙන් එළඹුණු ප්‍රධාන නිගමන, උපග්‍රන්ථය, සිතියම්, චිත්‍ර සටහන් හා ඡායාරූපාවලියකින් ද මෙය සමන්විත වේ.